සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11
**Third Term Test 2020** | **Grade 11**

බුද්ධ ධර්මය I
பௌத்த சமயம் I
**Buddhism I**

පැය එකයි
ஒரு மணித்தியாலம்
*One hour*

**සැලකිය යුතුයි:**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

1. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා වන්නේ,
   (1). භග්ගව තවුසා ය.  (2). ආලාරකාලාම තවුසා ය .
   (3). අසිත තවුසා ය .  (4). සර්වමිත්‍ර තවුසා ය .

2. කායික ව රෝගීව සිටි මුගලන් මහ රහතන් වහන්සේ බැහැදැක සුවදුක් විචාරනු වස් බුදු හිමියන් වැඩම කරන ලද්දේ,
   (1). සේනානි නියම්ගමට ය.  (2). පූර්වාරාමයට ය.
   (3). කලන්දක නිවාපයට ය.  (4). පිප්ඵලී ගුහාවට ය.

3. නෙක්ඛම්ම පාරමිතාව යනුවෙන් අදහස් කරන්නේ,
   (1). කිසිවෙකු නොරවටා මුළා නොකර සත්‍ය ගරුක ව ක්‍රියා කිරීම ය.
   (2). පංච ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත් වීම ය.
   (3). කය වචන දෙකෙහි සංවර බව ය.
   (4). ඇසුරු කරන්නන් පිළිබඳ මෛත්‍රියෙන් යුක්ත වීම ය.

4. සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් පරිදි ''ණය ගැතියෙකු ණය හිමිට යම් බැඳීමක් ඇත් ද එවිට වහලෙකුමෙන් යටත් ව ක්‍රියා කරන බව පෙන්වා දෙන නීවරණය වන්නේ,
   (1). කාමච්ඡන්ද නීවරණයයි.  (2). ව්‍යාපාද නීවරණයයි.
   (3). ථීන මිද්ධ නීවරණයයි.  (4). විචිකිච්ඡා නීවරණයයි.

5. රේරුකානේ චන්දවිමල නා හිමියන් විසින් පෙහෙවස් සමාදන් වන උපාසක උපාසිකාවන් උදෙසා අෂ්ටාංග උපෝසථ ශීලය පිළිබඳ කරුණු දක්වා රචනා කරන ලද ග්‍රන්ථය වන්නේ,
   (1). පොහොය දිනය.  (2). ධර්ම විනිශ්චය.
   (3). බෞද්ධයාගේ අත්පොත.  (4). අභිධර්ම මාර්ගය.

6. ''යම් සේ මුල් නිරුපද්‍රිතව තිබිය දී කපන ලද ගස නැවත නැවත ලියලයි ද'' ආදී වශයෙන් දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද දෙක කුමක් ද?

   (1). "යො චේ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ"
   (2). "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ"
   (3). "යථාපිමූලේ අනුපද්දවේ දළ්හේ - ඡින්නෝපි රුක්ඛෝ පුනරේවරූහති''
   (4). "ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං"

7. ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මිස රජ සැප පිණිස නොවේ'' මෙම ප්‍රකාශය කරන ලද්දේ,
   (1). වළගම්බා රජතුමා ය.  (2). දුටුගැමුණු රජතුමා ය.
   (3). අනගාරික ධර්මපාල තුමා ය.  (4). පරාක්‍රමබාහු රජතුමා ය.

8. කෘත්‍ය හෙවත් කාර්යය අනුව කර්මය සතරාකාර වේ. එම සතර ආකාරයට අයත් නොවන්නේ,
   (1). ජනක කර්මයයි.  (2). උපත්ථම්භක කර්මයයි.
   (3). උපපීඩක කර්මයයි.  (4). ආසන්න කර්මයයි.

9. බෞද්ධයාගේ නිත්‍ය ශීලය නම්,
(1). දස ශීලයයි. (2). අෂ්ටාංග උපෝසථ ශීලයයි.
(3). ගේහසිත ශීලයයි. (4). ආජීව අෂ්ටමක ශීලයයි.

10. බුදු පියාණන් වහන්සේ චූල්ලකම්ම විභංග සූත්‍රය දේශනා කරන ලද්දේ,
(1). යසකුල පුත්‍රයාට ය. (2). සුභ මානවකයාට ය.
(3). අනේපිඬු සිටුතුමාට ය. (4). කාලාමවරුන්ට ය.

11. බුදුරජාණන් වහන්සේ දර සහ ගිනි උපමා කරමින් හේතුඵල සම්බන්ධය පැහැදිලි කරනු ලබන්නේ,
(1). මහා නිදාන සූත්‍රයේදී ය. (2). කාලාම සූත්‍රයේදී ය.
(3). චක්කවත්ති සීහනාද සූත්‍රයේදී ය. (4). අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේදී ය.

12. පාලකයෙකු අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම,
(1). දානය ලෙස හැඳින්වේ. (2). ප්‍රිය වචනය ලෙස හැඳින්වේ.
(3). අර්ථචර්යාව ලෙස හැඳින්වේ. (4). සමානාත්මතාව ලෙස හැඳින්වේ.

13. පරාභව සූත්‍රයට අයත් **නොවන** කරුණක් වන්නේ,
(1). ධර්මයට අකැමැති වීම. (2). උත්සාහයෙන් තොර වීම.
(3). සත් පුරුෂයන් ප්‍රිය කිරීම. (4). අසත් පුරුෂ ධර්මයට ප්‍රිය වීම.

14. ගර්භයේ හැඩය නෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ,
(1). ධන්‍යාකාර ස්තූප ලෙසයි. (2). ඝණ්ඨාකාර ස්තූප ලෙසයි.
(3). ඝටාකාර ස්තූප ලෙසයි. (4). ආමලාකාර ස්තූප ලෙසයි.

15. බුදු පිළිම නිර්මාණයේ දී දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට නිරූපණය වන මුද්‍රාව නම්,
(1). අභය මුද්‍රාවයි. (2). ධ්‍යාන මුද්‍රාවයි.
(3). ධර්මචක්‍ර මුද්‍රාවයි. (4). විතර්ක මුද්‍රාවයි.

16. බෞද්ධ රාජ්‍ය පාලන මූල ධර්මවලට අයත් දසරාජ ධර්මයන්හි අන්තර්ගත කරුණක් වන්නේ,
(1). ප්‍රියවචනයයි. (2). අර්ථචර්යාවයි.
(3). සමානාත්මතාවයයි. (4). ඉවසීමයි.

17. සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් වන සිදත් සඟරාව රචනා වූ යුගය වන්නේ,
(1). දඹදෙණි යුගයේ දී ය. (2). කුරුණෑගල යුගයේ දී ය.
(3). ගම්පල යුගයේ දී ය. (4). කෝට්ටේ යුගයේ දී ය.

18. බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැට පෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධකවාකාර ගල් පුවරුව හැඳින්වෙන්නේ,
(1). අඩ්ඪචන්ද්‍රපාසාණ නමිනි. (2). කොරවක්ගල නමිනි.
(3). ආයක නමිනි. (4). මුරගල නමිනි.

19. බුදුරජාණන් වහන්සේ අට වන වස් කාලය ගත කරනු ලැබුවේ,
(1). මකුල පර්වතයෙහි ය. (2). භේෂකලා පර්වතයෙහි ය.
(3). විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය. (4). චාලිය පර්වතයෙහි ය.

20. විපරිණාම දුක්ඛ යන්නෙන් අදහස් වන්නේ,
(1). සාමාන්‍ය දුක පිළිබඳව ය. (2). ඇතිවීම පිළිබඳ දුක ය.
(3). නැතිවීම පිළිබඳ දුක ය. (4). වෙනස්වීම පිළිබඳ දුක ය.

21. '' සමග්ගා හෝථ මා විවදථ'' යන පාලි පාඨයෙහි අර්ථය වන්නේ,
(1). ''රාහුලයෙක් උපන්නා බන්ධනයක් ඇතිවුණා'' යන්නයි.
(2). ''වෛරයෙන් වෛරය නොසන්සිඳේ'' යන්නයි.
(3). ''සමගිවන්න විවාද නොකරන්න'' යන්නයි.
(4). ''යමෙකු පව් කළොත් ඔහු එයින් ම කෙලෙසෙන්නේය'' යන්නයි.

22. ''ආහාර මත්තඤ්ඤුතා'' හෙවත් පමණ දැන ආහාර ගැනීම පිළිබඳ බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ලබාගත් රාජ්‍ය පාලකයා වන්නේ,
(1). උදේනි රජතුමා ය. (2). කොසොල් රජතුමා ය.
(3). අජාසත් රජතුමා ය . (4). බිම්බිසාර රජතුමා ය .

23. තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොව දී ම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්ම රත්නය,
(1). ඕපනයික නම් වේ. (2). අකාලික නම් වේ.
(3). සන්දිට්ඨික නම් වේ. (4). ස්වාක්ඛාත නම් වේ.

24. ''කුසගින්න ලොව පවත්නා බලවත්ම රෝගයයි'' යනුවෙන් සඳහන් පාලි පාඨය වන්නේ,
(1). ''ජිගච්ඡා පරමා රෝගා'' යන්නය.
(2). ''ආරෝග්‍යා පරමා ලාභා'' යන්නය.
(3). ''ඉමස්මිං සති ඉදං හෝති'' යන්නය.
(4). ''යේ ධම්ම හේතුප්පභවා'' යන්නය.

25. මහින්දාගමනයට පෙර ලංකාවේ පැවති ඇදහිලි ක්‍රමයක් වනුයේ,
(1). මළවුන් ඇදහීමයි.
(2). දෙවියන්ට පින් දීමයි.
(3). බෝධි වන්දනාවයි.
(4). ස්තූප වන්දනාවයි.

26. බුදු රජාණන් වහන්සේ අනිමිසලෝචන පූජාව පැවැත් වූයේ සත් සතියෙන් කීවෙනි සතියේ දී ද?
(1). හතරවන සතියේ දී ය.
(2). තුන්වන සතියේ දී ය.
(3). දෙවන සතියේ දී ය.
(4). පළමු සතියේ දී ය.

27. බුදුරජාණන් වහන්සේ සතුව පැවති සත්ත්වයින්ගේ උපත හා මරණය දක්නා නුවණ හඳුන්වන්නේ,
(1). ආසවක්ඛය ඥානය ලෙසයි.
(2). චුතුපපාත ඥානය ලෙසයි.
(3). පුබ්බේ නිවාසානුස්සති ඥානය ලෙසයි.
(4). පරචිත්ත විජානන ඥානය ලෙසයි.

28. ''ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති'' යනුවෙන් මහා මංගල සූත්‍රයේ සඳහන් ගාථා පාඨයේ සඳහන් වන්නේ ,
(1). දරුවන්ට සංග්‍රහ කිරීම පිළිබඳව ය.
(2). පිදිය යුත්තන් පිදීම පිළිබඳව ය.
(3). අටලෝදහමින් කම්පානොවීම පිළිබඳව ය.
(4). ශිල්ප ශාස්ත්‍රයෙහි ප්‍රගුණ බව පිළිබඳව ය.

29. ආගමික ජීවිතය නැමති අතුපතර ඇති වෘක්ෂයෙහි මූල බීජය වන්නේ,
(1). ශ්‍රද්ධාවයි.
(2). සමාධියයි.
(3). සීලයයි.
(4). ප්‍රඥාවයි.

30. සිතෙහි නොසන්සුන්කම හා පසුතැවිලි වන ස්වභාවය හැඳින්වෙන්නේ,
(1). උද්ධච්ච කුක්කුච්ච නමිනි.
(2). ව්‍යාපාද නමිනි.
(3). කාමච්ඡන්දය නමිනි.
(4). විචිකිච්ඡා නමිනි.

31. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වන්නේ,
(1). ධර්මය විනය කොටස් කර භාණක පරපුරකට පැවරීම ය.
(2). අභිධර්ම පිටකය සම්පූර්ණ වීම ය.
(3). ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ය.
(4). අටළොස් නිකාය බිහිවීම ය.

32. සත්තසතිකා සංගීතිය නමින් හඳුන්වන්නේ,
(1). පළමු ධර්ම සංගායනාව ය.
(2). දෙවන ධර්ම සංගායනාව ය.
(3). තෙවන ධර්ම සංගායනාව ය.
(4). කණිෂ්ක සංගායනාව ය.

33. ''සිතින් දැඩිව අල්ලා නොගැනීම නිසා නැවත නැවත භවයට එකතු නොවේ'' යන්න සඳහන් වන පටිලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,
(1). ''වේදනා නිරෝධා තණ්හා නිරෝධා'' යන්නයි.
(2). ''තණ්හා නිරෝධා උපාදාන නිරෝධා'' යන්නයි.
(3). ''උපාදාන නිරෝධා භව නිරෝධා'' යන්නයි.
(4). ''භව නිරෝධා ජාති නිරෝධා'' යන්නයි.

34. ''විඤ්ඤාණ පච්චයා නාම රූපං'' යන්නෙන් පැහැදිලි වන්නේ,
(1). ප්‍රතිසන්ධි සිත හේතු කොටගෙන පංචස්කන්ධය ඇතිවීමයි.
(2). සළායතන හේතු කොට ස්පර්ශය ඇතිවීමයි.
(3). කුසල් අකුසල් රැස් කිරීම නිසා ප්‍රතිසන්ධි සිත පහළවීමයි.
(4). භවය නිසා නිමක් නැති දුක් අත් විඳීමයි.

35. කායානුපස්සනාව, වේදනානුපස්සනාව, ධම්මානුපස්සනාව, චිත්තානුපස්සනාව යන චතුර්විධ ක්‍රියාමාර්ගයන්හි යෙදීම ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි,
(1).සම්මා කම්මන්ත නම් වේ.
(2). සම්මා ආජීව නම් වේ.
(3). සම්මා වායාම නම් වේ.
(4). සම්මා සති නම් වේ.

36. බුදුරජාණන් වහන්සේ චූල්ලකම්ම විභංග සූත්‍රයේ දේශනා කළ පරිදි **ගරු කළ යුත්තන්ට ගරු කරන** තැනැත්තා,
(1). යසස් ඇතිව උපදී.
(2). පොහොසත්ව උපදී.
(3). උසස් යැයි සම්මත කුලවල උපදී.
(4). ප්‍රඥාවන්තව උපදී.

37. **විදර්ශනා සම්මා දිට්ඨිය** යනුවෙන් අදහස් කරන්නේ,
(1). තමන් කරන ක්‍රියාවේ විපාකය තමන් කරා පැමිණෙන බව දැකීමයි.
(2). සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීමයි.
(3). සෝවාන් ආදී මාර්ග සිත්වල පහළ වන සිව්සස් අවබෝධ කර ගන්නා දැක්මයි.
(4). සෝවාන් ආදී ඵල සිත්වල ඇතිවන දැක්මයි.

38. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාගේ කායික නීරෝගීතාව සඳහා සක්මන් මළුවක් අනුමත කරන ලද්දේ,
(1). විශාකාවගේ ඉල්ලීමකට අනුව ය.
(2). ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීමකට අනුව ය.
(3). අනේපිඬු සිටුතුමාගේ ඉල්ලීමකට අනුව ය.
(4). කොසොල් රජතුමාගේ ඉල්ලීමකට අනුව ය.

39. බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පැමිණියේ,
(1). කැප්පෙට්ටියා ලැහැබකට ය.
(2). තල් වනයකට ය.
(3). අනුපිය අඹ වනයට ය.
(4). සීත වනයට ය.

40. බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ හිඳිමින් තමන් වහන්සේගෙන් පිහිට ලැබිය යුතු අය පිළිබඳ විමසනු ලැබුයේ,
(1). පෙර බත් කිසෙහි දී ය.
(2). පෙරයම් කිසෙහි දී ය.
(3). මැදියම් කිසෙහි දී ය.
(4). පැසුළු යම් කිසෙහි දී ය.